

# කොඩියගෙ ළම

ලක්ෂමන් කොඩිතුවක්කු

## ජනාධිපතිවරණයට පෙර සතිය

"අපි ඉතින් කොහොමත් වහල්ලුනේ" මාටින් ආතා ඈත සිටම එනු දුටු මම ඔහු හා සිනාසුනෙමි.

"මාටින් ආතා බාහැරක් වගේ." ඔව් අද ටවුමේ රැස්වීමනේ. වීරවංශ මහත්තයා, ගෝඨා මහත්තයා, ඔක්කොම එනවලු. හොඳ හොඳ කතා ටිකක් අහගන්න පුළුවන් වෙයි, ඒ සමඟම ඈත සිට සයිකලය පැද ගෙන එනු දුටු පුද්ගලයා සැම්සන් මාමා බව මම හඳුනාගතිමි.

"ආ සැම්සන් මාමෙ කොහොමද? මොකද මේ හති දාගෙන දාඩිය මුගුරු පෙරාගෙන. කොහෙද යන්නේ කවුරු හරි කාට හරි කරදරයක් ද? "

"මොන කරදරයක් ද පුතේ මං මේ යන්නේ සජිත් මහත්තයගේ පින්තූර ටික ගන්න. ඒක ගෙනල්ලා ලී පටි ගහන්න දුන්නේ මටනේ. හෙට හන්දියේ රැස්වීමට යවන කට්ටියගෙ අතට දෙන්න."

"එතකොට ඒවා වැනුව කියලා රටට මොකක් හරි?"

රටට මොකක් හරි සෙතක් කර ගන්න තමයි අපිත් හදන්නේ. හෙට එනවා හොඳ හොඳ පොරවල් ටිකක්. හරීන් මහත්තයා, පොන්සේකා මහත්තයා, ගෝඨාට දෙයි ඇට්ටි හැලෙන්න. හොඳ හොඳ කතා ටිකක් අහගන්න පුළුවන්. නියමෙට තියෙයි.

"අපෙත් එහෙම තමයි. අද විමල් වීරවංශ මහත්තයා දෙයි හෝදා පාලු වෙලා යන්න."

"අනේ පලයන් යන්න මාටින් ගොයි-යා යන්න. මොනා හෝදා පාලු වෙලා යන්න ද.. උඹලගේ ලොක්කොනෙ හොරකම් කරල රට ණය කළේ. නැතිව සජිත් මහත්තයද. සජිත් මහත්තයගේ තාත්තට පින් සිද්ධ වෙන්න තමයි අද අපි මෙහෙම වත් ඉන්නේ. උඹගේ දුවත් ගුරුපත්වීම ගත්තෙ ප්‍රේමදාස මහත්තයගෙන්නේ. දැන් වාසි පිලට පැනගෙන"

"මේ සැම්සන් උඹට මම කිව්ව කියලා හිතේ තියාගනින්. අපේ දුවට ප්‍රේමදාස දීපු රැකියාවක් නොවෙයි ඕක. උන් දන්නවා අපි ඇස්. පී කාරයො නොවන වග. ඒ කාලේ පළාතෙ මන්ත්‍රීතුමාට රුපියල් දහදාහක් දීල තමයි පත්වීම හදාගත්තෙ. අහගන්න එපා උඹලගෙ කෙරුවාවල්. මහ බැංකුවත් බිඳලා එනව මෙතන සුද්ද කරන්න."

"අනේ පලයන් නාකියෝ යන්න... උඹලා බයියෝ උනත් මේ ඊයෙ පෙරේදා මහින්දගෙ යුද්දේ අස්සේ එල්ලගෙන හැමදාම යුද්දේ විකුණනවා. උඹගෙ දුවගේ ගුරු පත්වීමට සල්ලි ගන්න ඇත්තේ ඒකි හරියට විභාගෙ පාස් නැතිව ඇත. මක්කෙදාක්කා බලා මයියොක්කා ලියපු එවුන්නේ. ඒවගේ එවුන්ගෙන් තමයි රුපියල් දහදාහක් ගන්න ඇත්තේ වහල්ලු."

"අනේ පලයන් අලුගුත්තේරුවො යන්න. බෝතලේටයි බත් පැකට් එකටයි ඡන්දෙ දෙන එවුන්. උඹලගෙ එවුන්ට ඉගෙන ගන්න බැරි වුණා කියලා අපි පලිද.අපි හිතන්නෙ රට ජාතිය ගැන. උඹලා ජාතියක් ජන්මයක් නැති එවුන්නේ. උඹලට තියෙනවද රට ජාතිය ගැන කැක්කුමක්. හොර යක්කු."

"අපි විතරද නාකියො හොරු. උඹලත් හොරු නේ. අපි මහ බැංකුව විතරයි මංකොල්ල කෑවේ. උඹල මුළු රටම මංකොල්ල කෑවා."

මාටින් ආතා අමුඩ ලේන්සුව ගසා දමා සැම්සන් මාමා වෙත පැන්නේය. ඔව් යකෝ අපේ ලොක්කො හොරකං කළාට මොකද ඒ උත්තමයෝ හොරකං කලේ යුද්ද කරල රට බේරගෙන. උඹලගේ එවුන් හොරකං කලේ ඒ බේරගත්ත රටේ මහ බැංකුව. අඩු ගානේ පාරක් හැදුවද බලපන් අඩුගානේ පාරවල් ටික අර අයිවේද මොකක්ද අධිවේග මාර්ග ටික උඹලා අඩු ගානේ ගමේ පන්සලට යන පාරට තාර ටිකක් දාගන්න පුළුවන් වුනාද? "

"උඹලා වහල්ලු නේ මහින්ද ගේ, ගෝඨගේ බෙට්ටටත් වදින එවුන්." ඉතින් උඹලත් එහෙමනේ. සජියගේ සෙරෙප්පු වලින් සුප් හදලා බොන එවුන්නේ.

මම බොහෝ වේලා මොවුන් දෙනොගේ ආවේගශීලී සංවාදය අසා සිටියෙමි. තව ස්වල්ප වේලාවකින් එය ගුටි බැට හුවමාරුවක් දක්වා වර්ධනය වන බව මගේ සිතට දැනිණි.

දැන් මේ මාටින් ආතයි සැම්සන් අන්කලුයි රණ්ඩු වෙන්නේ කා වෙනුවෙන් ද? මම ඇසුවෙමි.

"නෑ පුතේ එහෙම කියන එක වටින්නේ නෑනේ. මූට අරක්කු ටිකක් දුන්නට කතිරෙ ගහන එකා බව ගමම දන්නවා. මොනා උනත් රට බේරගත්ත උත්තමය-නේ."

"උඹලගේ ලොක්කා දුටුගැමුණු ද? අනේ පලයන් යන්න. " මේ නාකියාට එහෙම කතා කරන් වටිනවාද මන් අහන්නේ පුතේ. මොනා උනත් ගම් උදාව හදල ගාමන්ට් පැක්ටරි දාලා රටට සෙතක් කරපු නායකයෙකුගේ පුතෙක්ට එහෙම කියන එක හරිද?

දැන් මාමයි ආතයි මගේ ප්‍රශ්නෙට හරි උත්තරයක් දුන්නේ නෑනේ. "අපි රණ්ඩු වෙන්නේ රට වෙනුවෙන්" දෙදෙනාම එකවර පිළිතුරු දුන්නේය. ඉතින් දෙගොල්ලොම රට හදල නම් ඇයි අපි රණ්ඩු වෙන්නේ. මෙච්චර දියුණු රටක මෙහෙම කැත විදියට රණ්ඩු වෙන මිනිස්සු ඉන්න බෑනේ. ඒ අතරතුර එතනට ආ උපාලි අයියා නිසා අපේ නිහඬතාව බිඳිණි.

"බලපන් උපාලි ළමයා මේ මාටින් කාරයා අපේ සජිත් මහත්තයට කියන කැත කතා. කිසිම හැදියාවක් නැහැ."

"අනේ බලපන් උපාලි පුතේ මේ සැම්සන්කාරයා රට බේරගත්ත අපේ උත්තමයට කියන කැත කතා කිසිම හැදියාවක් නැහැ."

දැන් සීයයි මාමයි රණ්ඩු වෙන්නේ දෙගොල්ලොම හදපු දියුණු රටක තාර කැඩුණු මහපාරක් මැදනේ. රට දියුණු වෙලා සීයයි මාමයි නොදියුණු ගොන් මැට්ටෝ දෙන්නෙක් වෙලා. දෙන්නම අමු හෙලුවැල්ලෙන් කඩේ යනවා.
අපි දෙදෙනම එකවර අදහස් පිට කළෙමි.

මාටින් ආතවයි සැම්සන් මාමටයි එකවර කේන්ති ගියේය. ඔවුන් දෙදෙනාම ඒ අසල තිබූ ඉනි වැටක් තබාගෙන අප දෙදෙනා වෙත පැන්නහ. "පල යන්න උඹලා දෙන්නම ජේ.වී.පී කාරයෝ රට ජාතිය ගැන කැක්කුමක් නැති කාලකන්නි. නේද මාටින් අයියෙ." සැම්සන් එසේ අසයි.

"අනේ මන්දා කතා කරලා වැඩක් නැහැ. හොරු අල්ලන්න උන් එකෙක් දෙන්නෙක්නේ පාර්ලිමේන්තුව යවනවා මිසක්කා රටේ බලය නං උන්ට දෙන්න නරකයි මල්ලි."

අපි දෙදෙනා වෙනුවෙන් උන් දෙදෙනා නැවත මිත්‍ර වීම අපේ සතුටට හේතු විය.

